# ජාතික රාජ්‍ය සභාවේ
# 1975 අංක 37 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කලේ 1975 සැප්තැම්බර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 සැප්තැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 37 දරන
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 81/72.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 37 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 2 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 434 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් විධාන කරනු ලබන ආකාරයකට අරමුදල සඳහා සාමාන්‍ය ගිණුමක් ද අරමුදලෙහි එක් එක් දායකයා සඳහා වෙනම ගිණුමක් ද විවෘත කොට පවත්වා ගෙන යා යුතු ය."; තව ද

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4) මේ ආඥාපනතෙහි කුමක් සඳහන්ව ඇත ද ශ්‍රී ලංකාවේ යම් එතර දූත මණ්ඩලයක සේවයේ නියුක්ත ශ්‍රී ලංකාවේ රටවැසියකු නොවූ විශ්‍රාම වැටුප් රහිත යම් සේවකයෙක්, මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවීමට ඔහුගේ ඇති බැඳීමෙන් ඔහුගේ කැමැත්ත පරිදි පාලක මණ්ඩලය විසින් නිදහස් කරනු ලැබිය හැකි අතර ඔහු එසේ නිදහස් කරනු ලැබූ දිනට පෙර එම තැනැත්තා මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවන් නකුව සිටි අවස්ථාවක දී අරමුදලෙහි ඔහුගේ ගිණුම වසා දැමිය යුතු ය ; තව ද ඔහුගේ ගිවිසුම සතුටුදායක ලෙස සම්පූර්ණ කර සේවයෙන් අස්වූයේ නම් ආඥාපනතේ 14 වන වගන්තිය යටතේ ඔහුට ගෙවනු ලැබිය හැකි ප්‍රමාණයක මුදලක් ද ඔහුට ගෙවිය යුතු ය.".

ඒ 15451—11,787 (75/07)

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 2අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" උපාධිධර යන්ගේ මාසිකව වැටුප් ගෙවනු ලැබූ තනතුරුවල පූර්ව සේවාවන්, සේවය ලෙස සැලකිය යුතු බව.

2අ. විශ්ව විද්‍යාලයක උපාධිධරයකු වූ ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දැරුවා වූ ද යම් තැනැත්තෙක් උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ පුහුණුවක් ලැබීම සඳහා එම තනතුරින් ඉල්ලා අස් වී එම පුහුණුවීමේ කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ආණ්ඩුව යටතේ මාසිකව වැටුප් ගෙවනු ලබන තනතුරකට පත් කරනු ලැබූ අවස්ථාවක, ආණ්ඩුව යටතේ මාසිකව වැටුප් ගෙවනු ලබන තනතුරක එම තැනැත්තාගේ පූර්ව සේවය මෙම ආඥපනත යටතේ දායක මුදල් ගෙවිය යුත්තේ යම් සේවයක් සම්බන්ධයෙන් ද එවැනි සේවයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එම තැනැත්තාගේ පූර්ව සේවයට සහ එම සේවය සම්බන්ධයෙන් මේ ආඥපනතෙහි විධිවිධාන අදාළ විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" අරමුදලට අනිවාර්ය යෙන් ගෙවිය යුතු දායක මුදල්.

4. (1) විශ්‍රාම වැටුප් රහිත සෑම සේවකයකු ම ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට හයක්, ආණ්ඩුවෙහි ඔහුගේ සේවය අවසන් වන තුරු අනිවාර්ය දායක මුදලක් වශයෙන් එක් එක් මාසයේ දී ගෙවිය යුතු ය.

(2) යම් මාසයක වේතනය වශයෙන් ලැබුණු මුදල මාසික වේතනයට අඩුව තිබීම හෝ ඒ මාසය වෙනුවෙන් වේතනය වශයෙන් කිසිම මුදලක් නොලැබ තිබීම ගැන නොතකා යම් මාසයක් සඳහා විශ්‍රාම වැටුප් රහිත සේවකයකුගේ අනිවාර්ය දායක මුදල ඒ සේවකයාගේ මාසික වේතනය අනුව ගණන් බලනු ලැබිය යුතු ය :

එසේ වුව ද දායකයකු නොකඩව ම මාස දෙකකට වැඩි කාල පරිච්ඡේදයකට අර්ධ වේතනයක් ලබන්නා වූ හෝ වේතනයක් නොලබන්නා වූ හෝ අවස්ථාවක, මාස දෙකකට වැඩි වන කාලපරිච්ඡේද යේ ඒ කොටස සම්බන්ධයෙන් ඔහුට ලැබෙන යම් වේතනයකින් සියයට හය බැගින් ගෙවීමට ඔහු විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ විශ්‍රාම වැටුප් රහිත සේවකයකු විසින් ගෙවිය යුතු යයි නියම කර ඇති හෝ බලය දී ඇති දායක මුදල එම සේවකයාගේ වේතනයෙන් අඩු කරගෙන අරමුදලට ගෙවිය යුතු ය. ".

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

" අරමුදලට ස්වේච්ඡාවෙන් ගෙවනු ලබන දායක මුදල්.

5. මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධාන වලට යටත්ව සහ නියම කළ හැකි කොන්දේසි වලට යටත්ව විශ්‍රාම වැටුප් රහිත සේවකයකු විසින් ඔහුගේ අනිවාර්ය දායක මුදලට අතිරේකව ඔහුගේ මාසික වේතනයෙන් සියයට හයකට වැඩි නොවන මුදලක් ස්වේච්ඡා දායක මුදලක් වශයෙන් අරමුදලට ගෙවනු ලැබිය හැකි ය :

එසේ වුව ද එවැනි යම් ස්වේච්ඡා දායක මුදලක් ගණන් බලනු ලබන ප්‍රමාණය, අර්ධ වාර්ෂික අන්තරයන්හි හැර වෙනස් නොකළ යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 14 වන වගන්තියේ (6) වන ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියෙහි 14 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

" (7) ඉහතින් වූ ඡේදවල සඳහන් හේතු හැර වෙනත් හේතු මත, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීම,".

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 16 වන වගන්තියෙහි (ආ) ඡේදය අගට පහත සඳහන් අලුත් අතුරු විධානය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියෙහි 16 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

" එසේ වුව ද යම් විශේෂ කාරණයක විශේෂ අවස්ථාවක දී, එම ප්‍රසාද මුදල සහ පොලිය හෝ එයින් යම් නිශ්චිත කොටසක් දායකයාට ගෙවිය යුතු යයි අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි විධාන කරනු ලැබිය හැකි ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියෙහි 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

" දායකයා මියගිය අවස්ථාවක ගෙවීම.

17. (1) දායකයකු මියගිය අවස්ථාවක, මේ ආඥාපනතෙහි විධිවිධානවලට යටත්ව,—

(අ) ගෙවිය යුතු මුදල රුපියල් විසි දහසකට වැඩි නොවන්නේ නම් නියම කර ඇති ආකාරයට එම කාර්යය සඳහා දායකයා විසින් නම් කරනු ලැබූ තැනැත්තාට හෝ තැනැත්තන්ට නැතහොත් එසේ නම් කිරීමක් කර නොමැති නම් මියගිය දායකයාගේ බූදලයේ බැරට හෝ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ අභිමතය පරිදි නීතියෙන් ඒ මුදල ලැබීමට හිමිකම් ඇතැයි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂට පෙනී

යන තැනැත්තාට හෝ තැනැත්තන්ට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ඒ මුදල ගෙවිය යුතු ය ;

(ආ) ගෙවිය යුතු මුදල රුපියල් විසි දහසකට වැඩි වන්නේ නම් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ඒ මුදල මියගිය දායකයාගේ බූදලයේ බැරට ගෙවිය යුතු ය :

එසේ වුව ද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂගේ මතය අනුව සහනාය දීම අවශ්‍ය නම්, මියගිය තැනැත්තාගේ අවමංගල වියදම් සඳහා හෝ මියගිය තැනැත්තාගේ වැන්දඹුවට, දරුවන්ට හෝ වෙනත් යැපෙන්නන්ට වහාම සහනය දීම සඳහා හෝ යම් එක් වතාවක දී විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් රුපියල් එක් දහසකට නොවැඩි මුදලක් ගෙවිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ගෙවනු ලැබූ යම් ගෙවීමක් ඒ දායකයා සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල පිළිබඳ වෙන යම් තැනැත්තකු විසින් ආණ්ඩුවට, මණ්ඩලයට හෝ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂට විරුද්ධව කරනු ලබන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වලංගු විය යුතු ය. බලපැවැත්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 20 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 20 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් හිමි ධුරයකට දායකයා පත් කිරීම.

20. අරමුදලේ දායකයකු, රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් හිමි ධුරයකට පත් කරනු ලැබ, ඒ ධුරයෙහි කාර්ය භාරය ගන්නා අවස්ථාවක—

(අ) ඒ දායකයා ඔහුගේ අලුත් ධුරයෙහි කාර්ය භාර ගන්නා දිනයෙහි ඔහුගේ ගිණුම වසා දැමිය යුතු ය ;

(ආ) ප්‍රසාද මුදල් සම්බන්ධයෙන් ලැබුණු පොලී යත් සමඟ ඒ දායකයාගේ ගිණුමට ආණ්ඩුව විසින් බැර කරනු ලැබූ ප්‍රසාද මුදල් ප්‍රමාණයෙහි සම්භාරය, ඒ අරමුදලින් ආණ්ඩුවට ගෙවනු ලැබිය යුතු ය ; තව ද

(ඇ) දායකයා විසින් අරමුදලට ගෙවනු ලැබූ යම් අනිවාර්ය දායක මුදල් හා ස්වේච්ඡා දායක මුදල් වේ නම්, එහි සම්භාර ප්‍රමාණය, ඒ දායක මුදල් සම්බන්ධයෙන් එකතු වූ පොලියත් සමඟ ඒ අරමුදලින් දායකයාට ගෙවනු ලැබිය යුතු ය. ".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 21 වන වගන්තිය ඉවත් කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ආණ්ඩුවට හෝ ලෝහෝර් ආර්යා ණය අරමුදලට අය විය යුතු මුදල් අඩු කිරීම.

23. දායකයකුගේ ගිණුමකට අරමුදලෙහි තිබෙන මුදල් ගෙවීමට පෙර ඒ දායකයාගෙන් ආණ්ඩුවට හෝ ලෝහෝර් ආර්යා ණය අරමුදලට අය විය යුතු යම් මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණයන් ඒ මුදල්වලින් අඩු කර ගත හැකි ය.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 28 වන වගන්තියෙහි "වේතනය" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

'"වේතනය" යන්නෙන් ඒකාබද්ධ වැටුප අදහස් වන අතර යම් පඩියක් සහ යම් පෞද්ගලික දීමනාවක් එයට ඇතුළත් වන නමුත් කවර වූ හෝ වෙනත් ගෙවීමක් හෝ දීමනාවක් එයට ඇතුළත් නොවේ;'.

**13.** මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 4 වන සහ 5 වන වගන්තිවල කරන ලද සංශෝධන 1972 ජනවාරි මස පළමුවන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

4 වන සහ 5 වන වගන්ති අතීතයටත් බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වීම.

**14.** මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි 28 වන වගන්තියෙහි කරන ලද සංශෝධන 1969 ඔක්තෝබර් මස පළමුවන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

28 වන වගන්තිය අතීතයටත් බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වීම.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.